මධ්‍යම අංශය

රාජකීය විද්‍යාලය කොළඹ 07

දෙවන වාර පරීක්ෂණය 2010

8 ශ්‍රේණිය කාලය : පැය 2 යි

## ඉස්ලාම්

නම : ............................................................... අංකය : ....................................

## I පත්‍රය

* **සියලුම ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.**
* **සෑම ප්‍රශ්නයකටම නිවැරදි පිළිතුර තෝරා එහි අංකය වරහන් තුල ලියන්න.**

01. අල්ලාහ්ගේ ශුද්ධ නම් ගණන වනුයේ,

i. 100 ii. 200 iii. 99 iv. 101 (........)

02. ඉබ්රාහිම් (අලෛ) ගේ පවුල සිහිපත් කරවන ඉබාදතය,

i. සලාත් ii. සකාත් iii. සව්ම් iv. හජ් (........)

03. ශුද්ධ වූ කෑබාඩ ප්‍රතිසංස්කරණය කල නබිවරයෙකි,

i. මූසා (අලෛ) ii. යූසුෆ් (අලෛ)

iii. ඉස්මායිල් (අලෛ) iv. හාරූන් (අලෛ) (........)

04. මූසා (අලෛ) තුමා ඉපිද හැදුණු වැඩුණු රට,

i. මද්යන් ii. ඊජිප්තුව iii. මක්කාව iv. මදීනාව (........)

05. ඊසා (අලෛ) තුමා පිළිගෙන ඔහුගේ ප්‍රචාරක කටයුතු වලට සහාය දැක්වූවන්,

i. මුස්ලිම්වරු ii. හවාපියයුන්වරු iii. කාෆිර්වරු iv. කුරෛෂිවරු (........)

06. "හුබ්බුර් රසුල් " යන්නෙන් අදහස්වන්නේ,

i. නබි (සල්) තුමාට ආදරය කිරීම

ii. නබි තුමා අනුගමනය කිරිම

iii. නබි තුමාට උපකාරකිරීම

iv. නබි (සල්) තුමා ප්‍රතික්ෂේප කිරීම

(........)

07. අප නබි (සල්) තුමාට සලවාත් 1 ක් කීවිට අල්ලාහ් අපට මෙපමණ සලවාත් කියයි,

i. 20 ii. 30 iii. 10 iv. 40

(........)

08. ස්වර්ගයේ පස් සකස්වී ඇත්තේ,

i. වැලි වලිනි

ii. කුංකුම වලිනි

iii. කිරි වලිනි

iv. පැණි වලිනි (........)

09. ඉස්ලාම් යන පදයට ඇති අරුතක් නොවේ,

i. යටත්වීම ii. ශාන්තිය iii. බාරවීම iv. පලිගැනිම

(........)

10. අනිවාර්යයෙන් ජමාඅත් වශයෙන් ඉටු කල යුතු සලාතය,

i. විත්ර් සලාතය

ii. ලුහර් සලාතය

iii. ජුම්ආ සලාතය

iv. සුබහ් සලාතය (........)

11. මයියතයන් වෙනුවෙන් ඉටුකරන සලාතය,

i. ජනසා සලාතය

ii. තහජ්ජත් සලාතය

iii. ඉස්රාහ් සලාතය

iv. මහ්රිබ් සලාතය (........)

12. ජමාඅත් සලාතය මෙහෙයවන්නා හඳුන්වනුයේ,

i. මඋමුම් ii. ඉමාම් iii. මුඋමින් iv. මුස්ලිම්

(........)

13. ඊමානය පරික්ෂාකිරීම සඳහා නුම්රුද්ගේ ගිනි ගොඩට දමනු ලැබු නබි,

i. ඉස්හාක් (අලෛ)

ii. මුහම්මද් (සල්)

iii. ආදම් (අලෛ)

iv. ඉබ්රාහිම් (අලෛ) (........)

14. සිකුරාදා දිනයේදී විශේෂයෙන් පාරායනා කරන සුරාව,

i. සුරා කහ්ෆ් ii. සුරා ෆාතිහා iii. සුරා නිසා iv. සුරා ෆලක්

(........)

15. "මම අල්ලාහ්ගෙන් පව් කමාව අයැදිමි" යන්නට අරාබි පදය,

i. සුබ්හානල්ලාහ් ii. ලාහිලාහඉල්ලාහ්

iii. අල්ලාහ් අක්බර් iv. අස්තහ්ෆිරුල්ලාහ්

(........)

16. සකාත් ලැබීමට හිමිකම් ඇති කණ්ඩායම් ගණන,

i. 10 ii. 8 iii. 12 iv. 4

(........)

17. රමළාන් මාසයේ විශේෂයෙන් ඉටුකරන සුන්නත් සලාතය,

i. ලුහා ii. තරාවිහ් iii. තහජ්ජද් iv. ලුහා

(........)

18. ඉබ්රාහිම් (අලෛ) සිහිපත් කරවන ඉබාදතය,

i. හජ් ii. සකාත් iii. සික්ර් iv. සව්ම්

(........)

19. දුල්හජ් මාසයේ ඉටු කරන කුර්බානය වනුයේ,

i. අකීකා ii. උල්හියා iii. නද්ර් iv. කුර්බාන්

(........)

20. සකාත් ලැබීමට සුදුසුකම් ඇති කණ්ඩායමක් නොවේ,

i. මිස්කින් ii. ෆකීර්

iii. ධනවතුන් iv. රිකාබ් (........)

(2 x 20 = ලකුණු 40)

## II පත්‍රය

- **පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
- **සියුලුම ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් හා අනෙකුත් ප්‍රශ්න සඳහා ලකුණු 11 බැගින්ද හිමිවේ.**

01. ඔබ පන්තියේ "සකාත්" වගකීම ගැනි සිදුකල සාකච්ඡාව ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. සකාත් යන පදයට ඇති අර්ථයක් කුමක්ද? (ලකුණු 02)

ii. සකාත් ලැබීමට සුදුසුකම් ඇති කණ්ඩායම් 4 ක් ලියන්න. (ලකුණු 04)

iii. සකාත් ගෙවීමෙන් අත්වන ප්‍රයෝජන 4 ක් ලියන්න. (ලකුණු 04)

iv. සකාත් ලැබීමට සුදුසුකම් නැති කණ්ඩායම් 2 ක් ලියන්න. (ලකුණු 04)

v. සකාතය වැදගත්කම ගැන ඔබ සිතන්නේ කුමක්ද? (ලකුණු 02)

02. i. ඉස්ලාම් යන පදයට ඇති අරුතක් කුමක්ද? (ලකුණු 03)

ii. ඉස්ලාම් ඔබට කියාදෙන යහපත් පුරුදු 4 ක් ලියන්න. (ලකුණු 04)

iii. ඔබ දෙමව්පියන්ට ඉටු කල යුතුකම් 2 ක් ලියන්න. (ලකුණු 04)

03. i. ජමාඅත් සලාත් යනු කුමක්ද? (ලකුණු 03)

ii. ජුම්ආ දිනයේ ඉටු කරන සුන්නත් වන කරුණු 4 ක් ලියන්න. (ලකුණු 04)

iii. ජමාඅත් ලෙස ඉටුකරන සුන්නත් සලාත් 2 ක් මොනවාද? (ලකුණු 04)

04. i. සව්ම් ඉටුකිරීමෙන් ඔබට අත්වන ප්‍රයෝජන 3 ක් ලියන්න. (ලකුණු 03)

ii. ඔබ අනිවාර්යයෙන් වැළකි සිටිය යුතු දිව හා සම්බන්ධ අකුසල් 4 ක් ලියන්න. (ලකුණු 04)

iii. රමළාන් මාසයේ ඔබ ඉටුකරන ඉබාදත් (නැමදීම්) 2 ක් ලියන්න. (ලකුණු 04)

05. i. සලාතයෙන් පසු කරන පාරායනා 2 ක් ලියන්න. (ලකුණු 03)

ii. ඔබ නබිතුමාට ආදරය කල යුත්තේ ඇයි ? හේතු 2 ක් ලියන්න. (ලකුණු 04)

iii. ස්වර්ගය ගැන ඔබ දන්නා දේවල් 2 ක් සඳහන් කරන්න. (ලකුණු 04)

06. පහත නබිවරුන් ගැන කෙටි සටහන් ලියන්න.

i. ඉබ්රාහිම් (අලෛ) (ලකුණු 06)

ii. ඊසා (අලෛ) (ලකුණු 05)